# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

දිනය Date 2025.08.30 පැය 0610 | දුරකථන අංකය Tel.NO 011-2887973 | මගේ අංකය My NO D/Media/Out/1666 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails dir.media@police.gov.lk


<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාතර්ා වූ වැදගත් තොරතුරු</u>

### 01. මනුෂ්‍ය ඝාතනයක් - හබරාදූව පොලිස් වසම.

2025.08.29 වන දින රාත්‍රී කාලයේ හබරාදූව පොලිස් වසමේ අමුකොටුව ප්‍රදේශයේදී කාන්තාවකට තියුණු ආයුධයකින් පහර දී ඝාතනය කර ඇති බවට හබරාදූව පොලිස් ස්ථානයට ලද පැමිණිල්ලක් මත විමශර්නයක් ආරම්භ කර ඇත.

**මරණකාරිය වයස අවුරුදු 42 ක් වූ පිලාන, අඟුලුගහ ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

පවුල් ආරවුලක් දුරදිග යාම හේතුවෙන් පුරුෂයා විසින් තියුණු ආයුධයකින් පහරදී මෙම ඝාතනය සිදුකර ඇති බවට දැනට සිදු කරන ලද විමශර්නයේදී අනාවරණය වී ඇත.

මෘත ශරීරය කරාපිටිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. සැකකරු අත්අඩංගුවට ගැනීම සඳහා හබරාදූව පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

### 02. දිය අනතුරකින් විදේශ ජාතිකයෙකු බේරා ගැනීම - කොට්ටුහල් පොලිස් ජීවිතාරක්ෂක ඒකකය.

2025.08.29 වන දින සවස් කාලයේ පොතුවිල් පොලිස් වසමේ කොට්ටුහල් මුහුදු තීරයේ දියමත ලිස්සා යාමේ ක්‍රීඩාවේ යෙදී සිටි විදේශ ජාතිකයෙකු දිය වැලකට හසුවී දියඹට ගසාගෙන යමින් සිටියදී කොට්ටුහල් පොලිස් ජීවිතාරක්ෂක ඒකකයේ පොලිස් සැරයන් 63382 රුවන්, පොලිස් කොස්තාපල් 96886 තරිඳු හා පොලිස් කොස්තාපල් 96976 කුමාර යන නිලධාරීන් විසින් බේරාගෙන ඇත.

**විදෙස් ජාතිකයා වයස අවුරුදු 40 ක් වන ස්වීඩන් ජාතිකයෙකු වේ.**

### 03. මනුෂ්‍ය ඝාතනයකට අවශ්‍ය කර සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - දෙහිවල පොලිස් ස්ථානය.

2025.05.10 වන දින දෙහිවල පොලිස් වසමේ මුහුදුබඩ මාගර්යේදී ගෙල සිරකර මනුෂ්‍ය ඝාතනයක් සිදු කිරීමේ අපරාධය සම්බන්ධයෙන් දෙහිවල පොලිස් ස්ථානය මගින් විමශර්න සිදු කරනු ලබයි.

ඒ අනුව 2025.08.29 වන දින රාත්‍රී කාලයේ දෙහිවල පොලිස් වසමේ චෛත්‍ය පාර ප්‍රදේශයේදී දෙහිවල පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත මෙම අපරාධයට අවශ්‍ය කර සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 38 ක් වන දෙහිවල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

දෙහිවල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 04. වෙඩි තබා තුවාල සිදු කිරීමේ අපරාධයකට අවශ්‍ය කර සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - බස්නාහිර පළාත දකුණ අපරාධ කොට්ඨාසය.

2025.08.06 දින රාත්‍රී කාලයේ මහරගම පොලිස් වසමේ නාවින්න හන්දිය ආසන්නයේ හයිලෙවල් මාගර්ය අසල රැඳී සිටි පුද්ගලයෙකුට යතුරු පැදියකින් පැමිණි නාඳුනන පුද්ගලයින් දෙදෙනෙකු විසින් වෙඩි තබා පලා යාමේ අපරාධය සම්බන්ධයෙන් බස්නාහිර පළාත දකුණ අපරාධ කොට්ඨාසය විසින් විමශර්න සිදු කරනු ලබයි.

ඒ අනුව 2025.08.29 වන දින රාත්‍රී කාලයේ කොට්ටාව නගරයේදී බස්නාහිර පළාත දකුණ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත මෙම අපරාධයේ වෙඩික්කරු ලෙස කටයුතු කල සැකකරු අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 39 ක් වන කිරිවත්තුඩුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සැකකරුගෙන් අනාවරණය වූ තොරතුරු මත සැකකරුගේ නිවසේ තිබී විදේශීය රටක නිෂ්පාදිත ෂොට්ගන් වගර්යේ ගිනි අවියක් හා බෝර 12 වගර්යේ පතරොම් 03ක් සොයාගෙන ඇත.

බස්නාහිර පළාත දකුණ අපරාධ කොට්ඨාසය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 05. මාරක රිය අනතුරක් - අනුරාධපුර පොලිස් වසම.

2025.08.29 වන දින රාත්‍රී කාලයේ අනුරාධපුර පොලිස් වසමේ පූජා නගරය කොහොඹගස් හන්දිය මාගර්යේ මල්වතුඔය යකඩ පාලම අසලදී සිංහ කණුව දෙස සිට කොහොඹගස් හන්දිය දෙසට ධාවනය වූ යතුරුපැදියක් පැදිකරුට පාලනය කරගැනීමට නොහැකිව මාගර්යෙන් ඉවතට පැන මාගර්ය අසල පිහිටි ගසක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ යතුරුපැදිකරු අනුරාධපුර රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 26 ක් වූ ගෝමරන්කල්ල, ගලෙන්බිඳුණුවැව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය අනුරාධපුර රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර අනුරාධපුර පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 06. මාරක රිය අනතුරක් - වලස්මුල්ල පොලිස් වසම.

2025.08.29 වන දින සවස් කාලයේ වලස්මුල්ල පොලිස් වසමේ හක්මන වලස්මුල්ල මාගර්යේ නතුවල හන්දිය ප්‍රදේශයේදී වලස්මුල්ල දෙස සිට හක්මන දෙසට ධාවනය වූ යතුරුපැදියක් සුනඛයෙකුගේ ගැටී යතුරුපැදිය මාගර්යේ පෙරළී ගොස් අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ යතුරුපැදිකරු වලස්මුල්ල රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 56 ක් වූ ගොඩවැන්න, මීඇල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය වලස්මුල්ල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. වලස්මුල්ල පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 07. මාරක රිය අනතුරක් - අරලගංවිල පොලිස් වසම.

2025.08.29 වන දින සවස් කාලයේ අරලගංවිල පොලිස් වසමේ අරලගංවිල මනම්පිටිය මාගර්යේ මැදගම ප්‍රදේශයේදී අරලගංවිල දෙස සිට මනම්පිටිය දෙසට ධාවනය වූ යතුරුපැදියක් මාගර්ය හරහා ගමන් කල පදික පුද්ගලයෙකුගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පදික පුද්ගලයා පොළොන්නරුව රෝහලේ ප්‍රතිකාර ලබමින් සිටියදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 77 ක් වූ මැදගම, දේවගල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය පොළොන්නරුව රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර අරලගංවිල පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**